(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

**අංක 1(1).]**

# පාර්ලිමේන්තුවේ අංක 1 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 සැප්තැම්බර් 04 සිකුරාදා**

---

**2020 සැප්තැම්බර් 22 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1978 වර්ෂයෙන් ඇරඹි පළමුවන පාර්ලිමේන්තුවේ සිට නවවැනි පාර්ලිමේන්තුව දක්වා එක් එක් පාර්ලිමේන්තුවට අදාළව පත් කරන ලද අමාත්‍ය මණ්ඩලවල සිටි කැබිනට්, රාජ්‍ය සහ නියෝජ්‍ය

(i) අමාත්‍යවරයන් සංඛ්‍යාව;

(ii) අමාත්‍යවරියන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම එක් එක් අමාත්‍ය මණ්ඩලයේ සිටි අමාත්‍යවරියන් සංඛ්‍යාව, අදාළ අමාත්‍ය මණ්ඩලයේ සිටි මුළු අමාත්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(ii) රටේ වර්තමාන කාන්තා ජනගහනයේ ප්‍රතිශතයට සරිලන සාධාරණ නියෝජනයක් අමාත්‍ය මණ්ඩලය තුළ කාන්තාවට ලැබී නොමැති බව පිළිගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

49/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල් අතරින් දැනට උසස් පෙළ තාක්ෂණික විෂය ධාරාව හැදෑරීමේ පහසුකම් ඇති පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) උසස් පෙළ තාක්ෂණික විෂයධාරාව හැදෑරීමේ පහසුකම් තවදුරටත් බදුල්ල දිස්ත්‍රික්කය තුළ පුළුල් කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

92/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ ඓතිහාසික වැදගත්කමක් ඇති උමං මාර්ග ජාලයක් ඇති බවත්;

(ii) මෙම උමං මාර්ග පිළිබඳ නිසි ගවේෂණයක් හා සංරක්ෂණයක් සිදුවී නොමැති හෙයින් විනාශ වෙමින් පවතින බවත්;

(iii) මේ පිළිබඳව ගවේෂණය කර සංරක්ෂණය කිරීමට පියවර ගැනීමෙන් රටේ ආරක්ෂක කටයුතු, ප්‍රවාහන කටයුතු හා සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා යොදාගත හැකි බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඓතිහාසික උමං මාර්ග පිළිබඳ ගවේෂණය ආරම්භ කිරීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) දැනට සොයාගෙන ඇති උමං මාර්ග සංරක්ෂණය කිරීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

(iii) ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

111/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අඩු ආදායම්ලාභී පවුල්වල 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් වන පාසල් සිසුන්ට ශිෂ්‍යාධාර ලබා දෙන බව එතුමා දන්නෙහිද;

(ආ) (i) 2019 වර්ෂයේදී 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයෙන් සමත්ව ශිෂ්‍යාධාර ලබන පාසල් සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට ශිෂ්‍යාධාර ලබා දීම සඳහා කොපමණ මුදලක් වෙන්කර තිබේද;

(iii) එම මුදලින් නිසියාකාරව ශිෂ්‍යාධාර මුදල් ලබා දී තිබේද;

(iv) 2020 වර්ෂය සඳහා ශිෂ්‍යාධාර වෙනුවෙන් කොපමණ මුදලක් වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ශිෂ්‍යාධාරලාභීන්ට නිසි කලට වේලාවට ශිෂ්‍යාධාර ලබා දී නොමැති බවට ඇති චෝදනා එතුමා පිළිගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2010 සිට 2018 දක්වා කොළඹ, රත්නපුර, ගාල්ල, මාතර, නුවර, කුරුණෑගල, යාපනය සහ ගම්පහ යන දිස්ත්‍රික්කවල පිහිටා ඇති ජාතික පාසල්වල 5 ශ්‍රේණියේ සහ 6 ශ්‍රේණියේ සමාන්තර පන්ති සංඛ්‍යාව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වර්ෂ 2010 සිට 2018 දක්වා ඉහත පාසල්වල,

(i) 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු කොපමණද ;

(ii) එම ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත 6 ශ්‍රේණියට ඇතුළත් වූ ළමුන් සංඛ්‍යාව කොපමණද;

(iii) 6 ශ්‍රේණියට ඇතුළත් වූ මුළු සිසුන් සංඛ්‍යාවෙන්, ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රතිඵල මත ඇතුළත් වූ සිසුන්ගේ ප්‍රතිශතය කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත පාසල්වල වර්ෂ 2010 සිට 2018 දක්වා 6 ශ්‍රේණියට ශිෂ්‍යත්ව ප්‍රතිඵල පදනම් කර නොගෙන ප්‍රාථමික අංශයේ සිට පැමිණි සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

53/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රජය සතුව ඇති සංස්ථා, මණ්ඩල, අධිකාරී වැනි ව්‍යවස්ථාපිත ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ආයතනවල දැනට සිටින සභාපතිවරුන් හා අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) එම සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

(v) එකී ආයතන මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

96/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හම්බන්තොට, රිදියගම සෆාරි උද්‍යානය තවදුරටත් වැඩිදියුණු කිරීමට රජය අපේක්ෂා කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම උද්‍යානයෙහි සිටින සතුන් සඳහා ප්‍රතිකාර කිරීමට ප්‍රමාණවත් ආරෝග්‍යශාලා පහසුකම් තිබේද;

(ii) ආරෝග්‍යශාලා පහසුකම් තවදුරටත් වැඩි දියුණු කිරීමට කටයුතු කරන්නේද;

(iii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2020 සැප්තැම්බර් 23 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2/2020

ගරු හේෂා විතානගේ මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෙරටට ටින් මාළු ආනයනය කරනු ලබන රටවල් කවරේද;

(ii) එම ටින් මාළු ආනයනය කරනු ලබන මෙරට සමාගම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2019 වර්ෂය තුළ පාරිභෝජනයට නුසුදුසු ටින් මාළු ආනයනය කළ අවස්ථා කවරේද;

(ii) එම ටින් මාළු ආනයනය කළ සමාගම් සහ ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) අදාළ ආනයන කටයුතු සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අවසරය ලබා දී තිබේද;

(iv) ආනයනය කළ භාවිතයට නුසුදුසු ටින් මාළු සඳහා ගනු ලැබූ පියවර කවරේද;

(v) 2019 වර්ෂයට පෙර අවස්ථාවලදී ද පරිභෝජනයට නුසුදුසු ටින් මාළු ආනයනය කර තිබේ නම්, එම අවස්ථාවලදී ආනයනය කළ සමාගම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

50/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති රජයේ පාසල් සඳහා අනුමත ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් විෂයයට අදාළව එම ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට සේවයේ නියුතු ගුරුවරු සංඛ්‍යාව කොපමණද;

(iv) බදුල්ල දිස්ත්‍රික්කය තුළ එක් එක් විෂයයට අදාළව දැනට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම ගුරු පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

93/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ දැනට ක්‍රියාත්මක වන ප්‍රජා පොලිස් ඒකක සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඒකක සඳහා අනුයුක්ත කර ඇති පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ප්‍රජා පොලිස් ඒකක හරහා ලබා ගත හැකි සේවාවන් පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ප්‍රජා පොලිස් ඒකකයන්ගේ පසුගිය වසරේ ප්‍රගතිය පිළිබඳ සෑහීමකට පත්විය හැකිද;

(ii) 2018 හා 2019 වර්ෂයන්හි දී ප්‍රජා පොලිස් ඒකකයන් විසින් සිදු කළ සේවයන්හි වටිනාකම මූල්‍ය අගයක් ලෙස තක්සේරු කර තිබේද;

(iii) එසේ නම්, එම මූල්‍යමය අගය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ප්‍රජා පොලිස් ඒකකයන්ගේ කටයුතු විධිමත් කිරීම සඳහා නව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළයුතු බව එතුමා පිළිගන්නේද;

(ii) එසේ නම්, නව පනත් කෙටුම්පතක් ඉදිරිපත් කිරීමට කටයුතු කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

112/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට සමෘද්ධි සහනාධාරලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට සව්බල ගැන්වූ සමෘද්ධි සහනාධාරලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමෘද්ධි සහනාධාරය ලබාගැනීමේ අරමුණින් ඉල්ලුම් කර ඇති පවුල් විශාල ප්‍රමාණයක් සිටින බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එම පොරොත්තු ලේඛණයේ ඇති පවුල් සඳහා සමෘද්ධි සහනාධාරය ලබාදීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, කවර දිනයක සිටද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

6/2020

ගරු හේෂා විතානගේ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ මේ වනවිට ලියාපදිංචි කර ඇති දහම් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී දහම් පාසල්හි උගන්වන ගුරුවරුන් සඳහා රජය විසින් ලබා දෙනු ලබන ප්‍රතිලාභ කවරේද;

(iii) එම දහම් පාසල් ගුරුවරුන් සේවය කරන්නේ ස්වෙච්ඡා පදනම මතද;

(iv) එසේ නම්, දහම් පාසල් ගුරුවරුන්ගේ සුභසාධනය වෙනුවෙන් සැලසුම් කර ඇති වැඩසටහන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2020 සැප්තැම්බර් 24 බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

3/2020

ගරු හේෂා විතානගේ මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2019 වර්ෂයේදී, මගී ප්‍රවාහන කටයුතු සඳහා,

(i) දුම්රිය භාවිතා කළ මගීන් සංඛ්‍යාව;

(ii) මගී ප්‍රවාහනයෙන් ලැබුණු ආදායම;

(iii) මුද්‍රණය කරන ලද දුම්රිය ප්‍රවේශ පත්‍ර සංඛ්‍යාව;

(iv) දුම්රිය ප්‍රවේශ පත්‍ර මුද්‍රණය සඳහා වැය කළ මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මගී ප්‍රවාහනය සඳහා දිනකට යෙදවිය යුතු දුම්රිය ගමන් වාර සංඛ්‍යාව;

(ii) සාමාන්‍යයෙන් දිනකට ක්‍රියාත්මක වන දුම්රිය ගමන් වාර සංඛ්‍යාව;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

51/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ප්‍රථම කොවිඩ් - 19 ආසාදිත රෝගියා වාර්තා වූ දිනය කවදාද;

(ii) එදින සිට අද දක්වා දිනපතා වාර්තා වූ කොවිඩ් - 19 ආසාදිත රෝගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එදින සිට දිනපතා සිදුකරන ලද පී.සී.ආර්. (PCR - Polymerase Chain Reaction ) පරීක්ෂණ සංඛ්‍යාව කොපමණද;

(iv) කොවිඩ් - 19 රෝගය මැඩපැවැත්වීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

94/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජෛව අවි භාවිතය ලෝකයේ එකඟතාවය මත තහනම් වුවද විවිධ දේශපාලන හා වෙළඳ උපක්‍රම සඳහා රහසිගතව තවමත් භාවිතා කරන බවත්;

(ii) ශ්‍රී ලංකාව ඇතුළු ඌන සංවර්ධිත රටවල් මෙම ජෛව අවි අත්හදා බැලීම් සඳහා ඉලක්ක වීමේ ඉඩක් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජෛව අවි ප්‍රහාර වළක්වා ගැනීමට රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

113/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධිකරණ අමාත්‍යාංශය මගින් සාමදාන විනිශ්චයකාර පත්වීම් ලබා දෙන බවත්;

(ii) එකී සාමදාන විනිශ්චයකාරවරුන් විශාල සමාජ මෙහෙවරක් ඉටුකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) සාමදාන විනිශ්චයකාරවරුන් පත්කිරීමේදී අවශ්‍ය වන අවම අධ්‍යාපන සුදුසුකම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අ.පො.ස (සා.පෙළ) අධ්‍යාපන සුදුසකම් ඇති විශාල සමාජ සේවකයන් ග්‍රාමීය වශයෙන් සිටින බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) එවැනි සමාජ සේවකයන්ට සාමදාන විනිශ්චයකාර තනතුරු ලබා දෙන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

7/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා විනාශ කර ඇති පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

(iii) එම පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට හේතු කවරේද;

(iv) අදාළ පුරාවිද්‍යා ස්ථාන විනාශ කළ පුද්ගලයන් හඳුනාගෙන තිබේද;

(v) ඔවුන්ට ලබාදුන් දඬුවම් කවරේද;

(vi) විනාශ කර ඇති, එහෙත් ඊට වගකිව යුතු පුද්ගලයන් හඳුනා නොගත් පුරාවිද්‍යා ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(vii) රටක ඓතිහාසික අභිමානය සුරකින පුරාවිද්‍යා ස්ථාන විනාශ කිරීමට එරෙහිව ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2020 සැප්තැම්බර් 25 සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4/2020

ගරු හේෂා විතානගේ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මධ්‍යම අධිවේගී මාර්ගයේ, කුරුණෑගල සිට ගලගෙදර දක්වා ඉදිවෙන කොටසේ,

(i) සමස්ත දුර ප්‍රමාණය කොපමණද;

(ii) ඇස්තමේන්තුගත මුළු වියදම කොපමණද;

(iii) පිවිසුම් හා පිටවීමේ දොරටු ස්ථාපනය වන ස්ථාන කවරේද;

(iv) ඉදිකිරීම් ආරම්භ කිරීමට හා අවසන් කිරීමට නියමිත දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම අධිවේගී මාර්ගයේ ඉහත කොටස සඳහා මේ දක්වා,

(i) පවරා ගත් ඉඩම් ප්‍රමාණය;

(ii) ගෙවා ඇති මුළු වන්දි මුදල;

(iii) ගෙවීමට ඇති වන්දි මුදල් ප්‍රමාණය;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) මෙම අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට පියවර ගන්නේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

52/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දැනට විදේශගතව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශ්‍රමිකයන් සේවයේ නියුතු රටවල්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් රටේ සේවයේ නියුතු ශ්‍රමිකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කොවිඩ් - 19 වසංගතය නිසා පීඩාවට පත් වී සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුබසාධනය සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

(ii) ඔවුන් මෙරටට ගෙන්වා ගැනීමට අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද?

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

95/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා නාවික හමුදාවේ සිවිල් පාලන නිලධාරී කාර්යාලයට අනුයුක්තව කොන්ත්‍රාත්/ආදේශක/අනියම් පදනම යටතේ විශාල පිරිසක් සේවය කරන බවත්;

(ii) මොවුන් දිවයින පුරා පිහිටි නාවික හමුදා උප කාර්යාලවල හා නාවික හමුදා රෝහල් ආදියෙහි සේවය කරන බවත්;

(iii) දෛනික පදනම මත මොවුන්ට වැටුප් ගෙවන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මොවුන්ගේ සේවය ස්ථිර කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) මොවුන්ගේ සේවය ස්ථිර කිරීමට කටයුතු කරන්නේ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8/2020

ගරු හේෂා විතානගේ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා දෙස් විදෙස් සංචාරකයන් විශාල සංඛ්‍යාවක් පැමිණෙන බවත්;

(ii) එම ආයතනය මගින් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තුමේන්තුවට වැඩිම ආදායමක් ලබාදෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා පින්නවල අලි අනාථාගාරය නැරඹීම සඳහා පැමිණි විදේශීය සංචාරකයන් සංඛ්‍යාව, එක් එක් කාර්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) වර්ෂ 2015 සිට 2019 දක්වා එමගින් ලැබුණු ආදායම එක් එක් වර්ෂය සහ කාර්තුව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණෙන සංචාරකයන්ට අලි පැටවුන්ට කිරි පෙවීම සඳහා අවස්ථාවක් ලබා දීම මේ වනවිට නවතා තිබේද;

(ii) එසේ නම්, එයට හේතු කවරේද;

(iii) අලි පැටවුන්ට කිරි පෙවීම සඳහා සංචාරකයන්ට අවස්ථාවක් ලබා නොදීම හේතුවෙන් ආයතනය වාර්ෂිකව ලබන අලාභය කොපමණද;

(iv) ශ්‍රී ලංකාවට වටිනා සම්පතක් වන පින්නවල අලි අනාථාගාරය වැඩිදියුණු කිරීම සඳහා රජය මගින් යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(v) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?